# අමාලියාගේ උපන්දිනය




# තිනුලි වික්‍රමරත්න

# අමාලියාගේ උපන්දිනය

තිනුලි වික්‍රමරත්න

# අමාලියාගේ උපන්දිනය

*කතෘ ප්‍රකාශනයකි.*

*ප්‍රථම මුද්‍රණය 2023 නොවැම්බර්*

## *කතෘන්ගේ වෙනත් කෘති*

- සිඟිති වැඩ පොත
- යාළුවුන පීරාෆ්
- වලස් පැංචාට පාඩමක්
- පුංචි මගේ සිතුවිලි
- සුපුනිට තෑග්ගක්
- හඳ ඇල්ලූ හැටි
- සතුටින් තෝරමු
- ආඩම්බර සමනලයා

# පිදුම

මට ජීවිතය දුන් මගේ ආදරණීය අම්මාටත්, තාත්තාටත්,

කුඩා කලම මා පුංචි කතුවරියක් කළ

මගේ දෙවැනි අම්මා වූ රංජනී සෙන්දනායක

ආදරණීය ගුරු මෑණියන්ටත්,

දැනට මා ඉගෙනුම ලබන **5**-A පන්තියේ

අමිතා කුමාරිහාමි ආදරණීය ගුරු මෑණියන්ටත්,

"ඔයාට පොත් ගොඩක් ලියන්න පුළුවන් තිනුලි"

කියමින් මා දිරිමත් කළ

ආදරණීය සමන්මලී ගුරු මෑණියන්ටත්,

පරිගණක කරනයෙන් අකුරු සකසා මෙම පොත

නිම කිරීමට මා හට සහයෝගය දුන්

මගේම ආදරණීය අක්කාටත්

මෙම පොත පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාවන්ත දැනුමින් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාව යි. එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හදුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සහිත ලේඛන අංකුර දහස් ගණනනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි. දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි. **2023** සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කර දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුලින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමව්පියන් ආදී ශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමන ලදී.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහමායා බාලිකා විද්‍යාලය
මහනුවර

**2023.11.01**

එකෝමත් එක කාලෙක පුංචි ගමක් තිබුණා



ඒ ගමේ අමාලියා කියලා ගැහැණු ළමයෙක් හිටියා. එයා දවසේ වැඩි කාලයක් ගත කළේ අත්තම්මා එක්කයි.






දවසක් එයාගේ අත්තම්මා ඇහුවා 'දුවේ ඔයා කැමතිද පින් කරන්න?' කියලා. ඊට පස්සේ අමාලියා කිව්වා 'ඔව් අත්තම්මේ මම හරි ආසයි පින් කරන්න'.




අත්තම්මා ඇහැව්වා 'කවදද අපි පින් කරන්න යන දවස කියලා?' අමාලියා කිව්වා 'අපි මගේ උපන්දිනේ දවසේ කරමු' කියලා

ටික දවසක් යනකොට අමාලියාගේ 8 වන උපන්දිනය ආවා.




අම්මා උදෙන්ම නැගිටලා අමාලියාට සුබ පැතුවා.



ඊට පස්සේ තාත්තා ඇසුවා 'අපි උපන්දින සාදයක් දාමු ද' කියලා අමාලියා කිව්වා 'බෑ තාත්තා උපන්දින සාදයක් එපා කියලා.' තාත්තා ඇහුවා 'ඇයි දුව'. ඊට පස්සේ අමාලියා කිවුවා. 'මම අත්තම්මත් එක්ක පොඩි වැඩක් කරන්න යනවා' කියලා.



අත්තම්මා කිව්වා ‘අපි පොඩි පින් අතේ වැඩක් කරන්න යනවා’

අම්මා ඇහුවා ‘කොහෙද යන්නෙ’ කියලා. අත්තම්මා කිවුවා. ‘අපි ළමා නිවාසයකට තෑගි දෙමු’ කියලා.



අමාලියා සතුටින් උඩ පැන්නා. සියල්ලෝ ම කඩිනමින් ගමනට සූදානම් උනා. තාත්තා ගමනට අවශ්‍ය සියලුම තෑගි සූදානම් කරගත්තා.

අමාලියාට දැන් හරිම සතුටුයි ... සියල්ලෝම සතුටින් ගමනට පිටත් වුණා.



දහවල් වෙද්දී අපි හැමෝම ළමා නිවාසෙට පැමිණියා. මුලින්ම අමාලියා තමයි ළමා නිවාසය ඇතුලට දුවගෙන ගියේ.



පුංචි යාළුවෝ දැක්ක අමාලියාට නම් හරිම සතුටුයි...

අමාලියා සහ පවුලේ සියලු දෙනා එකතු වී ළමයින්ට තෑගි බෙදා දුන්නා.



'අද තමයි මගේ ජීවිතයේ සතුටුම දවස' කියමින් අමාලියා සහ පවුලේ සියලු දෙනා එතනින් පිටත් වුණා.

# යාලුවනේ අපි නැවත හමුවෙමු!

# නිමි!

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයක් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොතපතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවත් ඔප් නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව **2014** වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතික නව මාවතකට යොමු කරමින් පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මේ විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් හා සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි. දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනනගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු...

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 .11. 01